බුද්ධ වර්ෂ 2555 - 2556

රාජ්‍ය වර්ෂ 2012



# බුදුසරණ

## 2012 - පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | |
|---|---|---|---|---|---|
| **දුරුතු මස පෝය 2011** | | | | | |
| දෙසැ. | 31 සෙන. | අ.භා. 10.40 න් පුර අටවක ලබා 2012 ජන 02 සඳුදා පූ.භා. 01.01 න් ගෙවේ | 01 | ඉරිදා | සිල් |
| **දුරුතු මස පෝය 2012** | | | | | |
| ජන 08 | ඉරිදා | අ.භා. 12.44 න් පුර පසළොස්වක ලබා 09 සඳුදා අ.භා. 12.58 න් ගෙවේ | 08 | ඉරිදා | සිල් |
| ජන 16 | සඳුදා | පූ.භා. 03.39 න් අව අටවක ලබා 17 අඟහ පූ.භා. 01.38 න් ගෙවේ | 16 | සඳුදා | සිල් |
| ජන 22 | ඉරිදා | අ. භා. 02.23 න් අමාවක ලබා 23 සඳුදා. අ.භා. 01.14 න් ගෙවේ | 22 | ඉරිදා | සිල් |
| **නවම් මස පෝය** | | | | | |
| ජන 30 | සඳුදා | අ.භා. 08.21 න් පුර අටවක ලබා 31 අඟ. අ.භා. 11.00 න් ගෙවේ | 31 | අඟහ. | සිල් |
| පෙබ 07 | අඟහ. | පූ.භා. 04.48 න් පුර පසළොස්වක ලබා 08 බදාදා. පූ.භා 03.23 න් ගෙවේ | 07 | අඟහ. | සිල් |
| පෙබ 14 | අඟහ. | පූ.භා. 11.35 න් අව අටවක ලබා 15 බදාදා. පූ.භා. 09.41 න් ගෙවේ | 14 | අඟහ. | සිල් |
| පෙබ 21 | අඟහ. | පූ.භා 03.54 න් අමාවක ලබා 22 බදාදා පූ.භා. 04.06 න් ගෙවේ | 21 | අඟහ. | සිල් |
| **මැදින් මස පෝය** | | | | | |
| පෙබ 29 | බදාදා | අ.භා. 05.39 න් පුර අටවක ලබා මාර්තු 01 බ්‍රහස්. අ.භා. 07.53 න් ගෙවේ | 29 | බදාදා | සිල් |
| මාර්තු 07 | බදාදා | අ.භා. 05.49 න් පුර පසළොස්වක ලබා 08 බ්‍රහස්. අ.භා. 03.08 න් ගෙවේ | 07 | බදාදා | සිල් |
| මාර්තු 14 | බදාදා | අ.භා. 07.48 න් අව අටවක ලබා 15 බ්‍රහස්. අ.භා. 06.20 න් ගෙවේ | 15 | බ්‍රහස්. | සිල් |
| මාර්තු 21 | බදාදා | අ.භා. 06.41 න් අමාවක ලබා 22 බ්‍රහස් අ.භා. 08.11 න් ගෙවේ | 22 | බ්‍රහස්. | සිල් |
| **බක් මස පෝය** | | | | | |
| මාර්තු 30 | සිකු. | අ.භා. 12.25 න් පුර අටවක ලබා 31 සෙන. අ.භා. 01.38 න් ගෙවේ | 30 | සිකුරා. | සිල් |
| අප්‍රේල් 06 | සිකු. | පූ.භා. 04.21 න් පුර පසළොස්වක ලබා 07 සෙන. පූ.භා. 00.49 න් ගෙවේ | 06 | සිකුරා. | සිල් |
| අප්‍රේල් 13 | සිකු. | පූ. භා 04.51 න් අව අටවක ලබා 14 සෙන. පූ.භා. 04.02 න් ගෙවේ. | 13 | සිකුරා. | සිල් |
| අප්‍රේල් 20 | සිකු. | පූ.භා. 10.28 න් අමාවක ලබා 21 සෙන. අ.භා. 12.50 න් ගෙවේ | 20 | සිකුරා. | සිල් |
| **වෙසක් මස පෝය** | | | | | |
| අප්‍රේල් 29 | ඉරිදා | පූ.භා. 03.19 න් පුර අටවක ලබා 30 සඳුදා පූ.භා. 03.32 න් ගෙවේ. | 29 | ඉරිදා | සිල් |
| මැයි 05 | සෙන. | අ.භා. 12.53 න් පුර පසළොස්වක ලබා 06 ඉරිදා පූ.භා. 09.07 න් ගෙවේ | 05 | සෙන. | සිල් |
| මැයි 12 | සෙන. | අ.භා. 03.28 න් අව අටවක ලබා 13 ඉරිදා අ.භා. 03.29 න් ගෙවේ | 12 | සෙන. | සිල් |
| මැයි 20 | ඉරිදා | පූ.භා. 02.43 න් අමාවක ලබා 21 සඳුදා පූ.භා. 05.18 න් ගෙවේ | 20 | ඉරිදා | සිල් |
| **පොසොන් මස පෝය** | | | | | |
| මැයි 28 | සඳුදා | අ.භා. 02.07 න් පුර අටවක ලබා 29 අඟ. අ.භා. 01.08 න් ගෙවේ | 28 | සඳුදා | සිල් |
| ජූනි 03 | ඉරිදා | අ.භා. 08.19 න් පුර පසළොස්වක ලබා 04 සඳුදා අ.භා. 04.04 න් ගෙවේ | 04 | සඳුදා | සිල් |
| ජූනි 11 | සඳුදා | පූ.භා. 03.49 න් අව අටවක ලබා 12 අඟහ. පූ.භා. 04.49 න් ගෙවේ | 11 | සඳුදා | සිල් |
| ජූනි 18 | සඳුදා | අ.භා. 06.33 න් අමාවක ලබා 19 අඟහ අ.භා. 08.31 න් ගෙවේ | 19 | අඟහ. | සිල් |
| **ඇසළ මස පෝය** | | | | | |
| ජූනි 26 | අඟ. | අ.භා. 09.46 න් පුර අටවක ලබා 27 බදාදා අ.භා. 08.04 න් ගෙවේ | 27 | බදාදා | සිල් |
| ජූලි 03 | අඟ. | පූ.භා. 03.23 න් පුර පසළොස්වක ලබා 04 බදාාදා. පූ.භා. 00.25 න් ගෙවේ | 03 | අඟහ. | සිල් |
| ජූලි 10 | අඟ. | අ.භා. 06.29 න් අව අටවක ලබා 11 බදාදා අ.භා. 08.24 න් ගෙවේ | 11 | බදාදා | සිල් |
| ජූලි 18 | බදාදා | පූ.භා. 09.07 න් අමාවක ලබා 19 බ්‍රහස් පූ.භා. 09.53 න් ගෙවේ | 18 | බදාදා | සිල් |
| **නිකිණි මස පෝය** | | | | | |
| ජූලි 26 | බ්‍රහස්. | පූ.භා. 03.27 න් පුර අටවක ලබා 27 සිකු. පූ.භා. 01.23 න් ගෙවේ | 26 | බ්‍රහස්. | සිල් |
| අගෝ 01 | බදාදා | පූ.භා. 11.02 න් පුර පසළොස්වක ලබා 02 බ්‍රහස්. පූ.භා. 09.01 න් ගෙවේ | 01 | බදාදා | සිල් |
| අගෝ 09 | බ්‍රහස්. | පූ.භා. 11.13 න් අව අටවක ලබා 10. සිකුරා. අ.භා. 01.42 න් ගෙවේ | 09 | බ්‍රහස්. | සිල් |
| අගෝ 16 | බ්‍රහස්. | අ.භා. 10.02 න් අමාවක ලබා 17 සිකු. අ.භා. 09.22 න් ගෙවේ | 17 | සිකුරා. | සිල් |
| **අධි බිනර මස පෝය** | | | | | |
| අගෝ 24 | සිකුරා. | පූ.භා. 08.28 න් පුර අටවක ලබා 25 සෙන. පූ.භා. 06.22 න් ගෙවේ | 24 | සිකුරා. | සිල් |
| අගෝ 30 | බ්‍රහස්. | අ.භා. 08.16 න් පුර පසළොස්වක ලබා 31 සිකු. අ.භා. 07.33 න් ගෙවේ | 31 | සිකුරා. | සිල් |
| සැප් 08 | සෙන. | පූ.භා. 05.31 න් අව අටවක ලබා 09 ඉරිදා පූ.භා. 07.56 න් ගෙවේ | 08 | සෙන. | සිල් |
| සැප් 15 | සෙන. | පූ.භා. 09.39 න් අමාවක ලබා 16 ඉරිදා. පූ.භා. 07.41 න් ගෙවේ | 15 | සෙන. | සිල් |
| **බිනර මස පෝය** | | | | | |
| සැප් 22 | සෙන. | අ.භා. 02.12 න් පුර අටවක ලබා 23 ඉරිදා අ.භා. 12.20 න් ගෙවේ | 22 | සෙන. | සිල් |
| සැප් 29 | සෙන. | පූ.භා. 08.06 න් පුර පසළොස්වක ලබා 30 ඉරිදා පූ.භා. 08.51 න් ගෙවේ | 29 | සෙන. | සිල් |
| ඔක් 08 | සඳුදා | පූ.භා. 00.04 න් අව අටවක ලබා 09 අඟ. පූ.භා. 01.50 න් ගෙවේ | 08 | සඳුදා | සිල් |
| ඔක් 14 | ඉරිදා | අ.භා. 08.30 න් අමාවක ලබා 15 සඳුදා අ.භා. 05.31 න් ගෙවේ | 15 | සඳුදා | සිල් |
| **වප් මස පෝය** | | | | | |
| ඔක් 21 | ඉරිදා | අ.භා. 09.51 න් පුර අටවක ලබා 22 සඳුදා. අ.භා. 08.31 න් ගෙවේ | 22 | සඳුදා | සිල් |
| ඔක් 28 | ඉරිදා | අ.භා. 11.20 න් පුර පසළොස්වක ලබා 30 අඟ. පූ.භා. 01.22 න් ගෙවේ | 29 | සඳුදා | සිල් |
| නොවැ 06 | අඟහ. | අ.භා. 05.34 න් අව අටවක ලබා 07 බදාදා. අ.භා. 06.18 න් ගෙවේ | 06 | අඟහ. | සිල් |
| නොවැ 13 | අඟහ. | පූ.භා. 07.14 න් අමාවක ලබා 14 බදාදා පූ.භා. 03.39 න් ගෙවේ | 13 | අඟහ. | සිල් |
| **ඉල් මස පෝය** | | | | | |
| නොවැ 20 | අඟහ. | පූ.භා. 08.24 න් පුර අටවක ලබා 21 බදාදා. පූ.භා. 07.57 න් ගෙවේ | 20 | අඟහ. | සිල් |
| නොවැ 27 | අඟහ. | අ.භා. 05.36 න් පුර පසළොස්වක ලබා 28 බදාදා. අ.භා. 08.17 න් ගෙවේ | 27 | අඟහ. | සිල් |
| දෙසැ. 06 | බ්‍රහස්. | පූ.භා. 09.02 න් අව අටවක ලබා 07 සිකුරා. පූ.භා. 08.46 න් ගෙවේ | 06 | බ්‍රහස්. | සිල් |
| දෙසැ 12 | බදාදා | අ.භා. 05.56 න් අමාවක ලබා 13 බ්‍රහස්. අ.භා. 02.13 න් ගෙවේ | 12 | බදාදා | සිල් |
| **උඳුවප් මස පෝය** | | | | | |
| දෙසැ 19 | බදාදා | අ.භා. 10.40 න් පුර අටවක ලබා 20 බ්‍රහස්. අ.භා. 11.22 න් ගෙවේ | 20 | බ්‍රහස්. | සිල් |
| දෙසැ 27 | බ්‍රහස්. | අ.භා. 01.27 න් පුර පසළොස්වක ලබා 28 සිකු. අ.භා. 03.50 න් ගෙවේ | 27 | බ්‍රහස්. | සිල් |

## දෙලොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්චන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම්තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරුදනවි පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන දද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුණු පොහෝ දිනකය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදාකය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින තෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය සමග වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝදා.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය දා භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑළවිය දා පසු වස් එළඹීමයි. සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණි සසුණේ ආරම්භය සිදුවිය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින්ද ව්‍යවාහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෛත්‍රී බෝසත්තුමා විවරණ ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසු වස් පවාරණය කළ යුතු දිනයද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහරතන් මෙහෙණින් වහන්සේගේ ලංකා ගමනය ගැන ලංකා මෙහෙණි සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

Kumarasiri@ANCL Production

වර්ෂ 2012 ක්වූ ජනවාරි 01 වනදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.